# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 2007 අංක 53 දරන පත්තිපිටිය, දෙපානම ශ්‍රී දෙව්රම් මහා විහාරස්ථ ශාසනාරක්ෂක සංවර්ධන සභාව (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කලේ 2007 නොවැම්බර් මස 12 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2007 නොවැම්බර් මස 16 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. 7.00 යි. තැපැල් ගාස්තුව : රු. 5.00 යි.

# 2007 අංක 53 දරන පන්නිපිටිය, දෙපානම, ශ්‍රී දෙව්රම් මහා විහාරස්ථ ශාසනාරක්ෂක සංවර්ධන සභාව (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2007 නොවැම්බර් මස 12 වන දින]

එල්. ඩී. —ඕ. එස්. එන්. සී. 23/2005.

පන්නිපිටිය, දෙපානම, ශ්‍රී දෙව්රම් මහා විහාරස්ථ ශාසනාරක්ෂක සංවර්ධන සභාව සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

"පන්නිපිටිය, දෙපානම, ශ්‍රී දෙව්රම් මහා විහාරස්ථ ශාසනාරක්ෂක සංවර්ධන සභාව" යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන සංගමයක් එකී සංගමයේ නීති රීති අනුව, එකී සංගමයට සම්බන්ධ සියලු පරමාර්ථ හා කාරණා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා ගෙන තිබුණු හෙයින් ද : පූර්විකාව.

එකී සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කාරණා සඳහා ද, ඒ පරමාර්ථ හා කාරණා මෙතෙක් කල් එකී සංගමය විසින් සාර්ථකව ක්‍රියාත්මක කර හා ඉටු කරගෙන ගොස් ඇති හෙයින් සහ එම සංගමය සංස්ථාගත කරනු ලැබීමට ඉල්ලුම් කර ඇති හෙයින් ද එකී ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2007 අංක 53 දරන පන්නිපිටිය, දෙපානම, ශ්‍රී දෙව්රම් මහා විහාරස්ථ ශාසනාරක්ෂක සංවර්ධන සභාව (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසු (මෙහි මින් මතු "සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) පන්නිපිටිය, දෙපානම, ශ්‍රී දෙව්රම් මහා විහාරස්ථ ශාසනාරක්ෂක සංවර්ධන සභාවේ දැනට සාමාජිකයන්ව සිටිනතාක් තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු සාමාජිකයන් වශයෙන් බඳවා ගනු ලබන තැනැත්තන් ද (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "පන්නිපිටිය, දෙපානම, ශ්‍රී දෙව්රම් මහා විහාරස්ථ ශාසනාරක්ෂක සංවර්ධන සභාව" යන නාමය හා අභිධානය යටතේ, අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, සංස්ථාව විසින් හා එයට විරුද්ධව ද එකී නාමයෙන් සියලු අධිකරණවල නඩු පවරනු ලැබිය හැකි ය. තව ද පොදු මුද්‍රාවක් තබා ගැනීමේ සහ පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය. පන්නිපිටිය, දෙපානම, ශ්‍රී දෙව්රම් මහා විහාරස්ථ ශාසනාරක්ෂක සංවර්ධන සභාව සංස්ථාගත කිරීම.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාවේ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

(අ) පත්නිපිටිය, දෙපානම, ශ්‍රී දෙව්රම් මහා විහාරයේ මන්දිර ගොඩනැගිල්ල, දාගැබ, බෝධි ප්‍රාකාරය හා අනෙකුත් සියලුම ගොඩනැගිලි නඩත්තු කිරීම සහ අළුත් ගොඩනැගිලි, ප්‍රාකාර සහ වෙනත් නිර්මාණ ඉදිකිරීම හා නඩත්තු කිරීම ;

(ආ) ත්‍රිපිටක ධර්මය ශිලා ලේඛනගත කිරීම පිණිස පිහිටුවා ඇති ''ත්‍රිපිටකය ශිලා ලේඛනගත කිරීමේ පදනම'' ප්‍රතිසංවිධානය කිරීම සහ කළමනාකරණය කිරීම ;

(ඇ) විහාරස්ථානයට ප්‍රවේශ වීමට සුදුසු මාර්ගයක් ඉදිකොට එය නඩත්තු කිරීම සහ විහාරස්ථාන භූමිය සංවර්ධනය කිරීම ;

(ඈ) ශ්‍රී ලංකාවේ සහ ඉන් පිටත පිහිටි වෙනත් බෞද්ධ සංවිධාන සමග මිත්‍ර සම්බන්ධතා පවත්වාගෙන යාම ;

(ඉ) ශ්‍රී දෙව්රම් මහා විහාරස්ථානයේ වැඩ වසන භික්ෂූන් වහන්සේලා සඳහා අධ්‍යාපන පහසුකම් සැපයීම සහ උන්වහන්සේලාගේ එදිනෙදා අවශ්‍යතා සපුරා ගැනීමට උපකාර කිරීම ;

(ඊ) බෞද්ධයන් අතර ධර්මය ප්‍රචාරය කිරීමේ කටයුතුවල යෙදීම ;

(උ) බුදුන්වහන්සේගේ ඉගැන්වීම්වලට අනුව ජීවත්වීම සඳහා බෞද්ධයන්ට අනුබල දීම ;

(ඌ) පිරිවෙන්, පාසල් පිහිටුවා නඩත්තු කිරීමෙන් සහ ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමෙන් බෞද්ධයන් අතර අධ්‍යාපනය නංවාලීම සහ ප්‍රවර්ධනය කිරීම ;

(එ) පුස්තකාල විඥාපණ හා පර්යේෂණ මධ්‍යස්ථාන පිහිටුවා පවත්වා ගෙන යාම, පොත්පත්, සඟරා, සමරු කලාප සහ වාර සඟරා ආදියට දායකවීම සහ ඒවා නිකුත් කිරීම ;

(ඒ) බෞද්ධාගම අදහන තැනැත්තන් වෙනුවෙන් පමණක් ප්‍රදර්ශන, දේශන, සම්මන්ත්‍රණ, දාර්ශනික සාකච්ඡා, වැඩමුළු, පන්ති, විවාද, සම්මේලන සහ චාරිකා පිළියෙල කිරීම, සංවිධානය කිරීම හා පැවැත්වීම;

(ඔ) බෞද්ධ උත්සව, චාරිත්‍ර, පූජා විධි, පිළිවෙත් හා පාරම්පරික සිරිත් ප්‍රවර්ධනය කිරීම හා සුරැකීම ; සහ

(ඕ) බුදු මග සංවිධානය ප්‍රතිසංවිධානය කිරීම හා කළමනාකරණය කිරීම.

4. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව පහත දැක්වෙන බලතල සංස්ථාවට ඇත්තේ ය :— සංස්ථාවේ සාමාන්‍ය බලතල.

(අ) යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නියාදනයක් ප්‍රකාර හෝ අන්‍යාකාරයකින් සංස්ථාව සතු වන යම් චංචල හෝ නිශ්චල යම් දේපළක් අත්කර ගැනීම සහ දැරීම ;

(ආ) එවැනි යම් දේපළක් විකිණීම, උකස් කිරීම, බදු දීම, හුවමාරු කිරීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම ;

(ඇ) සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කරගෙන යාමේ කාර්යය සඳහා අවශ්‍ය වන නිලධරයන් සහ සේවකයන් පත් කිරීම, සේවයෙහි යෙදවීම, ඔවුනට පාරිශ්‍රමික ගෙවීම, ඔවුන් විෂයයෙහි විනය පාලනය ක්‍රියාත්මක කිරීම සහ ඔවුන් සේවයෙන් පහ කිරීමට බලය තිබීම ;

(ඈ) දේශීය හෝ විදේශීය ප්‍රභවයන්ගෙන්, මුදලින් හෝ ද්‍රව්‍ය වලින් ලැබෙන ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග භාර ගැනීම ;

(ඉ) බැංකු ගිණුම් විවෘත කිරීම, පවත්වාගෙන යාම හා වසා දැමීම, ඇප ඇතිව හෝ ඇප නොමැතිව මුදල් ණයට ගැනීම හෝ ලබා ගැනීම ; සහ

(ඊ) සංස්ථාවේ මුදල් කළමනාකරණ කමිටුව විසින් තීරණය කරනු ලබන යම් සුරැකුම්පත්වල ආයෝජනය කිරීම.

සංස්ථාවේ ගිණුම් සහ විගණනය.

5. (1) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) සංස්ථාවේ සහ කළමනාකරණ කමිටුව විසින් සංස්ථාවේ ආදායම් සහ වියදම්, වත්කම් හා බැරකම් සහ වෙනත් සියලු ගණුදෙනු පිළිබඳ නිසි ගිණුම් තැබීමට සැලැස්විය යුතු ය.

(3) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ සාමාජිකයකු වූ ද සුදුසුකම් ලත් විගණකවරයකු විසින් සංස්ථාවේ ගිණුම් විගණනය කළ යුතු ය.

සංස්ථාවේ ආදායම සහ දේපළ යනාදිය යෙදවිය යුතු ආකාරය.

6. කවර ආකාරයකින් හෝ ලැබුණා වූ සංස්ථාවේ ආදායම සහ දේපළ මෙහි දක්වා ඇති පරිදි සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීම උදෙසා පමණක් යොදා ගනු ලැබිය යුතු අතර, ඉන් කිසිම කොටසක් ලාභාංශයක්, ප්‍රසාද දීමනාවක් හෝ අන් කවර හෝ ලාභයක ආකාරයෙන් සංස්ථාවේ සාමාජිකයන්ට ගෙවීම හෝ පැවරීම හෝ කරනු නොලැබිය යුතු ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම

7. (1) සංස්ථාවේ කටයුතු සභාපති, උප සභාපති, ලේකම්, උප ලේකම්, භාණ්ඩාගාරික සහ සංස්ථාවේ රීතිවලට අනුකූලව තෝරා පත් කරනු ලබන හය දෙනකුට නොඅඩු සාමාජිකයන් සංඛ්‍යාවකගෙන් සමන්විත වූ කළමනාකරණ කමිටුවක් විසින් මේ පනතේ අනෙකුත් විධිවිධානවලට සහ 8 වන වගන්තිය යටතේ සාදන ලද සංස්ථාවේ රීතිවලට අනුකූලව කළමනාකරණය, පාලනය සහ පරිපාලනය කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ ප්‍රථම කළමනාකාර කමිටුව, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ශ්‍රී දෙව්රම් මහා විහාරස්ථ ශාසනාරක්ෂක සංවර්ධන සභාවේ කළමනාකාර කමිටුවේ සාමාජිකත්වය දැරුවා වූ ද තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

සංස්ථාවේ රීති.

8. (1) පහත දැක්වෙන සියලුම කරුණු හෝ ඉන් කිසිවක් සඳහා මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති, සංස්ථාවේ යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් කලින් කල සංස්ථාව විසින් සෑදීම නීත්‍යානුකූල වන්නේය :—

(අ) සාමාජිකත්වය වර්ග කිරීම හා සාමාජිකයන් ඇතුළු කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ ඔවුන් නෙරපීම ;

(ආ) සංස්ථාවේ නිලධරයන් තෝරා පත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම, ඔවුන් ධුරය හිස් කිරීම හෝ ධුරයෙන් නෙරපීම් සහ ඔවුන්ගේ බලතල කර්තව්‍ය සහ කාර්ය ;

(ඇ) කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන් තෝරා පත් කර ගැනීම සහ කළමනාකරණ මණ්ඩලයේ බලතල, කර්තව්‍ය සහ කාර්ය සහ කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන්ගේ ධුර කාලය ;

(ඈ) සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, නියෝජිතයන්ගේ සහ සේවකයන්ගේ බලතල, චර්යාව, කාර්ය සහ කර්තව්‍ය ;

(ඉ) කළමනාකරණ මණ්ඩලයේ රැස්වීම් කැඳවීම, පැවැත්වීම සහ ඒ රැස්වීම්වල දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, ඒ රැස්වීම් පවත්වන දිනය, ස්ථානය, රැස්වීම් පිළිබඳ දැන්වීම්, න්‍යායපත්‍ර හා රැස්වීම්වල ගණපූරණය හා රැස්වීම්වල දී සාකච්ඡාවට භාජනය කළ යුතු කරුණු ;

(ඊ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම, සංස්ථාවේ අරමුදල්වල භාරකාරත්වය සහ සංස්ථාවේ ගිණුම් පවත්වාගෙන යාම හා ඒවා විගණනය කිරීම ;

(උ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම.

(2) සංස්ථාව විසින් සාදනු ලැබූ යම් රීතියක්, (1) වන උපවගන්තිය යටතේ ඒ රීතිය සාදනු ලැබූ ආකාරයෙන් ම සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ එය පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සියලුම සාමාජිකයන් සංස්ථාවේ තත් කාලයේ බලපවත්නා රීතිවලට යටත් විය යුතු ය.

9. (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු අතර ත්‍යාග, තෙස්තමේන්තු ප්‍රදාන, පැවරුම්, පරිත්‍යාග, සම්මාදම් මුදල් හෝ ගාස්තු වශයෙන් ලැබෙන සියලු මුදල් කළමනාකාර කමිටුව විසින් තීරණය කරනු ලබන බැංකු එකක හෝ වැඩි ගණනක සංස්ථාවේ නමින් තැන්පත් කරනු ලැබිය යුතු ය. සංස්ථාවේ අරමුදල.

(2) සංස්ථාවේ දේපළ පුනරුත්ථාපනය කිරීම, සංවර්ධනය කිරීම හෝ වැඩි දියුණු කිරීම සඳහා යම් අගය ක්ෂය වීමේ අරමුදලක් හෝ නිදන් අරමුදලක් සංස්ථාව විසින් පිහිටුවනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ බලතල සහ කාර්ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සඳහා සංස්ථාව විසින් දරනු ලැබූ සියලු වියදම් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාව විසින් ගෙවිය යුතු සහ සංස්ථාවට අයවිය යුතු ණය.

10. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වීමට පෙරාතුව ම වූ දිනයේ දී පැවති සභාව විසින් ගෙවිය යුතුව තිබූ සියලුම ණය හා බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලැබූ සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, එදිනට සභාවට අයවිය යුතුව තිබූ සියලුම ණය, සම්මාදම් මුදල් සහ දායක මුදල් මේ පනතේ කාර්යය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව.

11. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නියාදනයක් ප්‍රකාර හෝ වෙනත් යම් ආකාරයකින් හෝ සංස්ථාව වෙත පවරනු ලැබූ චංචල හෝ නිශ්චල දේපළක් දැරීමට නීතියෙන් සංස්ථාවට බලය ඇති අතර, ඒ දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බදුදීමේ, හුවමාරු කිරීමේ හෝ වෙනත් ආකාරයකින් නියාදනය කිරීමේ පූර්ණ බලය ඇතිව, මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව විසින් දැරිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව තැබිය යුතු ආකාරය.

12. සභාපති සහ ලේකම් හෝ භාණ්ඩාගාරික ඉදිරිපිට දී මිස, සංස්ථාවේ මුද්‍රාව කිසිදු සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් එම සාධන පත්‍රයේ තම තම අත්සන් කළ යුතු ය. එසේ කරනු ලබන අත්සන් කිරීමක් සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු කළ අත්සනකට පරිබාහිරව විය යුතු ය.

විසුරුවා හැරීමෙන් පසුව ඉතිරිවන දේපළ.

13. සංස්ථාව විසුරුවා හරිනු ලැබූ විට, එහි සියලු ණය සහ බැරකම් ගෙවා සමථයට පත් කරනු ලැබීමෙන් පසු කවර හෝ යම් දේපළක් ඉතිරි වේ නම්, ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදා දෙනු නොලැබිය යුතුය. එහෙත් සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, යම් ආදායමක් හෝ ලාභ කිසිවක් තම සාමාජිකයන් අතර බෙදා දීම රීති මගින් තහනම් කරනු ලැබ ඇත්තා වූ ද වෙනත් සංගමයකට හෝ සංගම්වලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. එම සංගමය හෝ සංගම් විසුරුවා හරින අවස්ථාවේ දී හෝ විසුරුවා හැරීමට පෙරාතුව ම හෝ කළමනාකරණ කමිටුව විසින් තීරණය කරනු ලැබිය යුතු ය.

14. ශ්‍රී ලංකා ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

15. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.